IHP
INSTITUTE FOR HEALTH POLICY

72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2024 පෙබරවාරි 29
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව 11.59

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at’ ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at’ ihp.lk ට්විටර්: @ravirannaneliya

# 2024 ජනවාරි ජනාධිපතිවරණ අපේක්ෂිත ඡන්ද මනාපවලින් අනුර කුමාර දිසානායක (50%) ඉදිරියෙන් සිටියි.

## *2024 ජනවාරි IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම*

2024 ජනවාරි IHP ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය (SLOTS) MRP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය තාවකාලික ඇස්තමේන්තු වලින් පෙන්නුම් කරන්නේ 36%ක (පෙර මාසයේ සිට +2) ප්‍රතිශතයක් ලැබූ ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාස මෙන්ම 7% බැගින් ප්‍රතිශතය ලැබූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ ශ්‍රී.ල.පො.පෙ. පොදු අපේක්ෂකයා යන දෙදෙනාවත් අභිබවා සියලු වැඩිහිටියන්ගෙන් 50%ක (-1) සහයක් ලබමින් ජා.ජ.බ./ජ.විපෙ. නායක අනුර කුමාර දිසානායක පෙරමුණ ගෙන ඇති බවයි.






2024 ජනවාරි මස IHP SLOTS MRP ආකෘතියේ සිදු කළ සංශෝධනයක් මත මෙම ඇස්තමේන්තු පදනම් වී ඇති අතර, මෙමඟින් මාසික වෙනස්කම් වඩාත් සුමට කිරීම සහ නියැදීමේ විෂමතාවයන් නිසා ඇතිවන උච්චාවචනයන් අඩු කිරීමට අදහස් කෙරේ. මෙම යාවත්කාලීනය සියලුම වැඩිහිටියන් සඳහා වන අතර, 2024 ජනවාරි මාසයේ සිදු කළ සම්මුඛ පරීක්ෂණ 506ක් ඇතුළුව, 2021 ඔක්තෝම්බර් සිට 2024 පෙබරවාරි 26 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 15,590ක දත්ත භාවිත කරමින් සංශෝධිත MRP ආකෘතියක් මත රඳා පවතී. අවිනිශ්චිතතාවය ගණනය කිරීම සඳහා පුනරාවර්තන 100 ක් සිදු කරන ලදී. ජනවාරි සඳහා දෝෂ ආන්තිකය 1-3% ලෙස තක්සේරු කෙරේ.

IHP SLOTS MRP ක්‍රමවේදය තුළදී ප්‍රථමයෙන් 'multilevel statistical model" මඟින් ප්‍රතිචාර දක්වන්නන්ගේ විවිධ ලක්ෂණ සහ ඔවුන්ගේ අදහස් අතර සම්බන්ධය ඇස්තමේන්තු කරයි, මෙහිදී 'අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද' යන්න යොදා ගෙන ඇත. පසුව එය 2021 ඔක්තෝබර් සිට සෑම මාසයකම ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය පුරෝකථනය කිරීමට ('post-stratification') ජාතික ජනගහනයට ක්‍රමාංකනය කරන ලද විශාල දත්ත ගොනුවක් භාවිතා කරන ලදී. Multilevel model පවතින අවිනිශ්චිතතාවයන් පිළිබිඹු කිරීමට සහ දෝෂ ආන්තිකය ලබා ගැනීමට ආකෘතිය 100 වතාවක් ඇස්තමේන්තු කර ඇත.

**Related Reports**


Institute for Health Policy, June 2023, “Pres. Ranil Wickremesinghe & SLPP continue to gain support in May. IHP Presidential Election Voting Intentions Update May 2023”.
*Available at:* [https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306302.pdf](https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306302.pdf)

Institute for Health Policy, July 2023, “Little change in Presidential voting intention in June 2023: AKD 40%, Sajith 35%, Ranil 15%. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update June 2023”.
*Available at:* [https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230728.pdf](https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230728.pdf)

Institute for Health Policy, August 2023, “Pres. Ranil Wickremesinghe continues to gain support in a potential Presidential poll. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update July 2023”.
*Available at:* [https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230822.pdf](https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230822.pdf)

Institute for Health Policy, September 2023, “AK Dissanayake (38) and Sajith Premadasa (35) continue to lead in Presidential Election voting preferences. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update August 2023”.
*Available at:* [https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230926.pdf](https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230926.pdf)

Institute for Health Policy, November 2023, “AK Dissanayake consolidates lead in Presidential Election voting intent. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update October 2023”.
*Available at:* *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231124.pdf*

Institute for Health Policy, January 2024, “AK Dissanayake leads in Presidential Election voting preferences on 50%, with Sajith Premadasa on 33% of all adults in December. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update December 2023”.
*Available at:*
https://www.ihp.lk/sites/default/files/press-release/IHPPressRelease20240130.pdf

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 ජනවාරි MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 506ක් සහ 2021 ඔක්තෝබර් 1 සිට 2024 පෙබරවාරි 26 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 15,590ක් මත පදනම් වන අතර අනුර දිසානායක, සජිත් ප්‍රේමදාස සඳහා 2.5-3.0%ක සහ රනිල් වික්‍රමසිංහ සහ අනෙකුත් ප්‍රධාන අපේක්ෂකයා සඳහා 0.5-1.5%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයන ලදී. IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය දක්වයි. අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. තවද, සමීක්ෂණයේ සොයාගැනීම් හරහා අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.